# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/AS/CMA/3/Circular
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2011-10-28

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක - 219 /2011

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

## 2011 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම.

මුදල් රෙගුලාසි 429 අනුව, 2011 මුදල් වර්ෂය සඳහාවූ ගිණුම් පොත් 2011 දෙසැම්බර් 31 දිනට පියවිය යුතුව ඇත. ඒ අනුව 2011 වර්ෂයට අදාල ගිණුම් සාරාංශ, මාරු නියෝග හා අනෙකුත් එවැනි ගිණුම් වාර්තා පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි නිවැරදිව හා විධිමත් ලෙස ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් සියළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති උපදෙස් තරයේ පිළිපැදීමත් ඒවාට අනුකූල වීමත් අවධාරණය කරනු ලැබේ.

## 1. 2011 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවීම.

මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් පිළිපැදිය යුතුය.

## 2. 2011 දෙසැම්බර් මාසයේ පළමු ගිණුම් ප්‍රකාශය නිකුත් කිරීම.

2.1 2011 දෙසැම්බර් මාසයට අදාල සියළු උප කාර්යාලවල ගිණුම් ද, වැරදි නිවැරදි කිරීම් ද, ඇතුලත් වූ ඒකාබද්ධ ගිණුම් සාරාංශ, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 215/2010 සඳහන් වර්ගීකරණය අනුව පහත පරිදි ඉදිරිපත් කළ යුතුවේ.

i. පළමු උපලේඛණයේ සඳහන් ආයතන 2012 ජනවාරි 11 ට පෙර

ii. දෙවන උපලේඛණයේ සඳහන් ආයතන 2012 ජනවාරි 14 ට පෙර

2.2 දෙසැම්බර් මස පළමු ගිණුම් සාරාංශයෙන් වාර්තා කර ඇති පරිදි සියළුම ලැබීම් හා ගෙවීම් ද වාර්තා වූ සියළුම වැරදි නිවැරදි කිරීම් ද ඇතුලත් 2011 දෙසැම්බර් මාසය සඳහා වූ පළමු ගිණුම් ප්‍රකාශය 2012 ජනවාරි 18 දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි http/www.treasury.gov.lk වෙබ් අඩවිය වෙත මුදා හරිනු ඇත.



මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733

2.3 ඔබ විසින් මාසික ගිණුම් සාරාංශ මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වැය ශීර්ෂයන්ට කරන ලද හර කිරීම් තිබේ නම් අදාළ ගිණුම් ප්‍රකාශ පරික්ෂා කර එවැනි ඇතුලත් කිරීම් වහාම නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය.

2.4 අමාත්‍යාංශ ප්‍රතිව්‍යුහගත කිරීමේදි වගකීම් පැවරීම හා ගිණුම් ගැලපීම සම්බන්ධයෙන් 2010 -05-10 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 148 හා 2010-05-19 දින නිකුත් කල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 208/2010 සහ 2010-04-30 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය නැවත යොමු කරවන අතර එම උපදෙස් වලට අනුකූලව ක්‍රියා කර ඇති බව තහවුරු කරගත යුතුය.

2.5 මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව ගිණුම් ප්‍රකාශ වෙබ් අඩවිය හරහා ලබා ගැනීම සම්බන්ධයෙන් යම් අපහසුතාවකට මුහුණ දීමට සිදුවන්නේ නම් මෙම චක්‍රලේඛයේ 11 වන ඡේදයේ නම් සඳහන් ඕනෑම නිලධාරියෙකු වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

## 3. 2011 දෙසැම්බර් මාසය සඳහා දෙවන හා අවසන් ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම.

3.1 සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා පළමු ගිණුම් ප්‍රකාශණ මගින් අනාවරණය කර ගන්නා ලද ගිණුම් දෝෂ නිවැරදි කිරීම ද ඇතුලත් දෙවන සහ අවසාන ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට 2012 ජනවාරි 26 දිනට පෙර ඉදිරිපත් කල යුතුය. භාණ්ඩාගාර සංඛ්‍යා සමග සැසඳීමේදි මතුවන සියළු වැරදි අදාළ ආයතන විසින්ම දෙවන හා අවසාන ගිණුම් සාරාංශයට සටහන් ඇතුලත් කරමින් නිවැරදි කළ යුතුය. එමෙන්ම වැරදි නිවැරදි කිරීම් වලදි එය වෙනත් අමාත්‍යාංශයක /දෙපාර්තමේන්තුවක වැය ශීර්ෂයකට සම්බන්ධ වන අවස්ථාවලදි ඒ සඳහා එම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. වැරදි නිවැරදි කිරීමට භාණ්ඩාගාරයට යොමු කළ යුත්තේ සිය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ගිණුම් සාරාංශයෙන් එම සටහන් යෙදීම ප්‍රායෝගික නොවන විට පමණි. කෙසේ වුවද වැරදි නිවැරදි කිරීම පිණිස මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන මාරු නියෝග වල නිවරදිතාවය සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වගකීම භාරගනු නොලැබේ.

3.2 දෙවන හා අවසාන ගිණුම් ප්‍රකාශ වල ඇතුලත් විය යුතු මු.රෙ. 69 යටතේ වූ මාරු කිරීම් ඉල්ලුම් පත් 2012 ජනවාරි 26 දින හෝ ඊට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතුවේ. මෙම මු.රෙ 69 මාරුකිරීම් ඉල්ලුම් පත් භාණ්ඩාගාර ලේකම් හෝ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් අනුමත කල යුතු බැවින් එම ඉල්ලුම්පත් 2012 ජනවාරි 26 දින හෝ ඊට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතුවේ. නිවැරදි කිරීමක්, මාරුපත්‍රයක් හෝ මු.රෙ. 69 මාරු කිරීම් සඳහා වූ අයදුම් පත්‍රයක් සම්බන්ධයෙන් වූ ඉල්ලීමක් , මොනයම් කරුණක් නිසාවත් 2012 ජනවාරි 26 දිනට පසු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් භාරගනු නොලැබේ. (මු.රෙ. 66 ඉල්ලුම්පත් 2011 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර අනුමත කරවා ගත යුතුවේ.) විදේශ ව්‍යාපෘතිවල ප්‍රතිපාදන මාරුකිරීමේදි 2011 වර්ෂය වෙනුවෙන් වූ අවසන් ප්‍රතිලාභීන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කරගත යුතුය.

3.3 2011 දෙසැම්බර් මාසය සඳහා වූ අවසන් ගිණුම් ප්‍රකාශ 2012 පෙබරවාරි 18 දිනට හෝ ඊට පෙර වෙබ් අඩවිය මගින් නිකුත් කිරීමට කටයුතු යොදනු ලැබේ. මීට සමගාමීව මෙම ගිණුම් ප්‍රකාශ වල දෘඩ පිටපතක් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 07 වන ඡේදයේ සඳහන් කර ඇති පටිපාටිය අනුගමනය කරමින්, ලබා ගැනීම පිණිස මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් සේවා අංශයේ තබනු ඇත.

## 4. <u>පොදු කරුණු</u>

4.1 ෆැක්ස් මාර්ගයෙන් සහ ඡායා පිටපතක් වශයෙන් එවන ගිණුම් සාරාංශ / මාරු නියෝග භාරගනු නොලැබේ.

4.2 දෙසැම්බර් මාසය සඳහා වූ ප්‍රධාන ගිණුම් සාරාංශයෙන් පසුව ගිණුම් ගත නොවූ අයිතමයන් හා වැරදි සටහන් නිවැරදි කිරීමට ඉදිරිපත් කරනු ලබන දෙවන සහ අවසන් ගිණුම් සාරාංශ **"2011 දෙසැම්බර් දෙවන සහ අවසාන "**යන මැයෙන් ඉදිරිපත් කළ යුතුය.

4.3 මාසික ගිණුම් සාරාංශ, ඩිස්කට් (Diskettes) මගින් ඉදිරිපත් කරන අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, තම දෙවන සහ අවසන් ගිණුම් සාරාංශ ද ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කළ යුතු අතර එම ඩිස්කට් **"2011 දෙසැම්බර් දෙවන සහ අවසාන "** වශයෙන් සටහන් කර ඉදිරිපත් කළ යුතුය. සියළුම වැරදි සටහන් නිවැරදි කිරීම හා මාරු කිරීම් මෙම ඩිස්කට් හි ඇතුලත් කළ යුතු අතර, මාරු නියෝග දෘඩ පිටපත් භාරගනු නොලැබේ.

4.4 "බී "පන්තියේ දෙපාර්තමේන්තු විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට එවනු ලබන සෑම මාරු පත්‍රයකම උඩ වම් කෙළවරෙහි "2011 මුදල් වර්ෂය - මුල් පිටපත" යන්න සඳහන් කළ යුතුවේ. අතිරේක පිටපත් ඉදිරිපත් නොකළ යුතුය. අමතර පිටපත් එවීම හේතුවෙන් සිදුවන ද්වි ගණනයන් සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වග කියනු නොලැබේ.

4.5 යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක්, වෙනත් එවැනි ආයතනයකින් භාණ්ඩ හා සේවා 2011 වර්ෂය තුල ලබාගෙන ඇත්නම් ඊට අදාල බිල්පත් නොපමාව 2011දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ගිණුම් ගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

4.6 ගිණුම් පියවීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව කර ගෙන යාම පිණිස වෙනත් දෙපාර්තමේන්තු වැය ශීර්ෂ වලට සිදු කරන ලද හර/බැර කිරීම් පිළිබඳ විස්තර අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අප්‍රමාදව සැපයිය යුතුය.

4.7 නිලධාරින්ට නිකුත් කරනු ලබන උප අග්‍රිම 2011 දෙසැම්බර් මස 31 දින වන විට සම්පූර්ණයෙන් පියවා ගත යුතු බැවින් අවසාන සති දෙක තුළ එම නිකුත් කිරීම් අත්‍යවශ්‍ය කරුණකට හැර ලබා නොදීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

## 5. <u>තැන්පත් ගිණුම</u>

5.1 වසර අග ඉතිරි මුලා ප්‍රතිපාදන තැන්පත් ගිණුම් වලට මාරු කිරීම පිණිස අවසර දෙනු ලබනුයේ මු.රෙ 215(3)(c) හි විධි විධාන අනුව පමණි. එවැනි ඉල්ලීම් අදාල ප්‍රධාන ගණන්දීමේ/ගණන්දීමේ නිළධාරි මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් එම ඉල්ලීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දැනුම් දෙනු ලැබීමෙන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුව විසින් 6000/0/0/11 යටතේ තැන්පතු ගිණුම් අංක ලබා දෙනු ඇත. එම ඉල්ලීම් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන දැනුවත් කරනු ඇත.

එවැනි ඉල්ලීම් සියල්ල 2012 ජනවාරි 20 වැනි දින හෝ ඊට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ/ ගණන් දීමේ නිලධාරීන් විසින් කළයුතු වේ. එමෙන්ම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දැනට පවත්වා ගෙන යනු ලබන විවිධ තැන්පත් ගිණුම් වලට මෙම මුලා ප්‍රතිපාදන මාරු කිරීම සිදු නොකළ යුතුය.

5.2 2010-07-12 දින නිකුත් කර ඇති 2010/209 අංක දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාර විවිධ තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් 2011/12/31 දිනට ඉදිරිපත් කළ යුතු පොදු තැන්පත් ගිණුම පිළිබඳ අවසාන සැසඳුම් වාර්තාව කලට වේලාවට සකස් කිරීම පිණිස 2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ කේවල ශේෂ උපුටා ගැනිම පොත් පියවූ වහාම සිදුකළ යුතුය. එවිට නියමිත දිනට පෙර එම සැසඳුම් ප්‍රකාශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට එවිය හැකිය. එම අවසාන සැසඳුම් ප්‍රකාශයේ පිටපතක් විගණකාධිපති වෙත යැවීමට ක්‍රියාකළ යුතුය.

## 6. <u>අත්තිකාරම් ගිණුම්</u>

වාණිජ ගබඩා හා රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් වැනි අත්තිකාරම් ගිණුම්වලට සත්‍ය වශයෙන් කරනු ලබන හර කිරීම් හා බැර කිරීම් වලට මු.රෙ. 503 (1) ප්‍රකාර ගැලපුම් කිරීමෙන් පසුව පමණක් අත්තිකාරම් ගිණුම් සීමාව ඉක්මවීමක් සිදුවී ඇත්ද යන්න දැනගත හැකි බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට එම සීමා ඉක්මවීම් හඳුනා ගැනීමට හැකියාවක් නොමැත. එබැවින් 2011 සැප්තැම්බර් මස සත්‍ය සංඛ්‍යා දැන ගත් වහාම ඉදිරි කාර්තුව සඳහා ඇති වෙතැයි අපේක්ෂිත ගණුදෙනු (ලැබීම් සහ ගෙවීම්) සලකා බලමින් සීමා ඉක්මවීම ගණන් බලා අවශ්‍ය වෙතොත් වහාම විධිමත් අනුමැතියක් මගින් සීමා සංශෝධනය කර ගැනීමට ද ඉදිරියේදී සීමා ඉක්මවීමක් නොවීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන උපක්‍රම යෙදවීමට ද අදාල ආයතන ක්‍රියාකළ යුතුය.

## 7. <u>අවසාන ගිණුම් ප්‍රකාශය</u>

දෙවන සහ අවසාන ගිණුම් සාරාංශයෙහි වැරදි නිවැරදි කිරීම් සැලකිල්ලට ගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අවසන් ගිණුම් ප්‍රකාශය 2012 පෙබරවාරි 18 වන දින හෝ ඊට ප්‍රථම නිකුත් කරන අතර, එම අවසාන ගිණුම් ප්‍රකාශන භාර ගැනීම පිණිස බලය පවරනු ලැබූ ලිපියක් සමග නිලධාරියකු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට ක්‍රියා කරන මෙන් සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව වෙත නිලධාරියෙකු එවීමට අපහසු යම් ආයතනයක් වෙතොත් ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් සිදුකළ විට එම ලේඛණ තැපැල් කර එවීමට ක්‍රියා කරනු ඇත.

8. ගිණුම් පියවීමේ ක්‍රියාවලිය නිම කිරීමට ප්‍රථම භාණ්ඩාගාර පොත්වල පෙන්නුම් කරන එක් එක් ආයතනය වෙනුවෙන් ඇති තැන්පතු සහ අත්තිකාරම් ගිණුම්වල අවසාන ශේෂයන් හා ආයතනයේ පොත්වල පෙන්නුම් කෙරෙන ශේෂයන් අතර, විෂමතාවයන් නොමැති බවට තහවුරු කර ගන්නා ලෙසට තවදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

9. මේ සමග අමුණා ඇති කාල සටහනෙහි සඳහන් කර ඇති ඉලක්ක දිනයන්ට පෙර ගිණුම් පියවීමේ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කරමි.

10. ගිණුම් පියවීමේ ක්‍රියාවලිය ඉහත විස්තර කර ඇති පරිදි බාධාවකින් තොරව පවත්වා ගෙන යන බවට සහතික වීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන්දීමේ නිළධාරියාගේ වගකීම වේ.

11. ගිණුම් පියවීම සම්බන්ධව තව දුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් නිළධාරීන්ට අමතන ලෙසට දන්වනු කැමැත්තෙමි.

| | |
|---|---|
| අධ්‍යක්ෂ (ගිණුම් සේවා) | 2484753 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සැකසුම්) | 2484735 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (දත්ත සැකසුම්) | 2484736 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගිණුම් සේවා) | 2484737 |

එන්. ජී. දයාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත් - 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහා බැංකුව

## 2011 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමට අදාල විවිධ කාර්යයන් සඳහා නිශ්චිත අවසාන දිනයන්

| | |
|---|---|
| ❖ මුදල් පොත පියවීම | 2011 දෙසැම්බර් 31 දින |
| ❖ 2011 දෙසැම්බර් මාසයට අදාල ගණුදෙනු ඇතුලත් පළමු ගිණුම් සාරාංශය. ඉදිරිපත් කිරිම. | - (i) පළමු උප ලේඛණයේ සඳහන් ආයතන. 2012 ජනවාරි 11 ට පෙර<br>- (ii) දෙවන උප ලේඛණයේ සඳහන් ආයතන. 2012 ජනවාරි 14ට පෙර |
| ❖ 2011දෙසැම්බර් මාසයට අදාල ගිණුම් සාරාංශ ඇතුළත් පළමු ගිණුම් ප්‍රකාශන නිකුත් කිරිම. | 2012 ජනවාරි 18 දින හෝ ඊට පෙර |
| ❖ මුල්‍ය ප්‍රතිපාදන තැන්පත් ගිණුමට මාරු කිරිම. | 2012 ජනවාරි 20 දින හෝ ඊට පෙර |
| ❖ දෙවන හා අවසාන ගිණුම් ප්‍රකාශණ වල ඇතුලත් විය යුතු මු.රෙ. 69 අයදුම්පත්‍ර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිම | 2012 ජනවාරි 26 දින හෝ ඊට පෙර |
| ❖ අනුමත මු.රෙ. 69 අයදුම්පත්‍ර හා වැරදි නිවැරදි කිරිම් ඇතුලත් දෙවන හා අවසන් ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත භාරදීම. | 2012 ජනවාරි 26 දින හෝ ඊට පෙර |
| ❖ දෙවන හා අවසන් ගිණුම් සාරාංශ අනුව වැරදි - නිවරදි කිරිම් ඇතුලත් අවසන් ගිණුම් ප්‍රකාශ නිකුත් කිරිම. | 2012 පෙබරවාරි 18 දින හෝ ඊට පෙර |